# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2352/07 - 2023 ඔක්තෝබර් මස 03 වැනි අඟහරුවාදා - 2023.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය*: GODS/LND/05/ACQ/RDA/GODS/LND/05/SUR/2022/08.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/5/2021/HW/115.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රක්වාන ගමේ, අංක 231සී, රක්වාන දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් රත්නපුර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් 2023.07.19 දිනැතිව පිළියෙළ කරන ලද අවසාන ගම් පිඹුරු අංකය 699, අතිරේක අංකය 21 හා පත්‍ර අංකය 21 හි පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0182 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (03):

01. **කැබලි අංක. 1930**
ඉඩමේ නම: ඇලර්ටන් වත්ත; ඉඩමේ විස්තරය: වත්ත, අවුරුදු 10 - 15 ක් පමණ වයසැති මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: බී. කේ. චමින්ද ලක්සිරි, දෙනියාය පාර, රක්වාන, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0007.

02. **කැබලි අංක. 1931**
ඉඩමේ නම: ඇලර්ටන් වත්ත; ඉඩමේ විස්තරය: වත්ත, අවුරුදු 10 - 15 ක් පමණ වයසැති මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: විල්බට් මුණසිංහ, දෙනියාය පාර, රක්වාන, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0140.

03. **කැබලි අංක. 1932**
ඉඩමේ නම: -; ඉඩමේ විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0035.

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.10.18 දින පෙරවරු 10.00 ට ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023.10.11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**ජී. එල්. ඩබ්. ඒ. ප්‍රතිභා,**
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරී,
ගොඩකවෙල.

2023 සැප්තැම්බර් මස 20 වැනි දින,
ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

EOG 10 - 0007

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය*: KDS/HAR/4/2/1/55.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/18/2019 /WS/530.

මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජලසම්පාදන ව්‍යාපෘතියේ කුරුදුගහමඩ ඉහළ සේවා ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීමට අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ යහලතැන්න කන්ද ගමේ පිහිටි, මහනුවර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන පිළියෙළ කරන ලද අංක 320504 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 01හි පත්‍ර අංක 1හි කැබලි අංක 1 ලෙස දක්වෙන පහත විස්තර සඳහන් ඉඩම් කොටසේ මායිම්:

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: යහලතැන්න වත්ත; මුල් හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්. 0.0643.

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ පාර; නැගෙනහිරට: පාර; දකුණට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන යහලතැන්නවත්ත; බටහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන යහලතැන්නවත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා).

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.11.29 වැනි දින පෙරවරු 10.00 ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023.11.22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**මොහාන් ධර්මදාස,**
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2023 සැප්තැම්බර් මස 27 වැනි දින,
නුගවෙල, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0008